# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 39 දරන ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 22 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි.          තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 39 දරන ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 48/95.

**ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගනු ලැබූ හෙයින් ද ; පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 39 දරන ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද "ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි කලින් කල එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව, සංස්ථාව විසින්, එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය. ශ්‍රී ලංකා නාණක විද්‍යා අධ්‍යයන සංගමය සංස්ථාගත කිරීම.

2—D 042384—5,900 (96/11)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) නාණක විද්‍යාව පිළිබඳව මහජනයා තුළ දැනුමක් ඇති කිරීමෙන් සහ නාණක විද්‍යාඥයන් අතර අදහස් හුවමාරු කර ගැනීමට උනන්දු කරවීමෙන් නාණක විද්‍යාව ප්‍රවර්ධනය කිරීම:

(ආ) විවිධ වර්ගයේ කාසි, වටිනා කාසි සහ ඓතිහාසික වටිනාකමක් ඇති නෝට්ටු සංරක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සැලැස්ම සකස් කිරීම සහ නාණක විද්‍යාඥයන්ගේ පරිහරණය සඳහා විද්‍යාගාරයක් පිහිටුවීම :

(ඇ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල භාවිත කරනු ලැබූ කාසි, වටිනා කාසි සහ නෝට්ටු පිළිබඳ පරිගණක දත්ත සමුදායක් ඇති කිරීම ;

(ඈ) නාණක විද්‍යාව පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අදහසින් නාණක විද්‍යා කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් පිහිටුවා පවත්වා ගෙන යාම:

(ඉ) නාණක විද්‍යාව පිළිබඳ තොරතුරු බෙදාහැරීම සඳහා සඟරා, විෂය ග්‍රන්ථ පොත් සහ වාර සඟරා ප්‍රකාශයට පත් කිරීම:

(ඊ) නාණක විද්‍යාව පිළිබඳ සම්මේලන, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන පැවැත්වීම : සහ

(උ) ඉහත සඳහන් පරමාර්ථ ප්‍රවර්ධනය කර ගැනීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හා යෝග්‍ය වන්නා වූ වෙනත් සියලු පියවර ගැනීම.

සංස්ථාවේ බලතල.

4. ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත සඳහන් බලතල තිබිය යුතු අතර, ඒවා සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා ඕනෑම නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම, දැරීම, බදු දීම හෝ බද්දට ගැනීම, කුලියට දීම, උකස් කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

(ආ) කෙළින්ම සංස්ථාව විසින් හෝ නිලධරයකු මගින් හෝ තත් කාර්යය සඳහා සංස්ථාව විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නියෝජිතයකු මගින් සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් වලට හා එකඟවීම්වලට එළඹීම හෝ ඒවා ඉටු කිරීම:

(ඇ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් තැනැත්තන්, නියෝජ්‍යායතන සහ සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම, ඔවුන්ට සහාය දීම, ඔවුන්ගෙන් සහාය ලබා ගැනීම සහ ඔවුන් සමග සම්බන්ධතා වර්ධනය කර ගැනීම:

(ඈ) සංස්ථාවේ ශාඛා, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පිහිටුවීම:

(ඉ) තාණක විද්‍යාව පිළිබඳ සාකච්ඡා, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, කණ්ඩායම් අධ්‍යයන සහ ප්‍රසිද්ධ දේශන සංවිධාන කිරීම සහ පැවැත්වීම:

(ඊ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන්‍යාකාරයකින් තෑගි, ප්‍රදාන, පරිත්‍යාග, සහනාධාර ලැබීම :

(උ) බැංකු ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම, චෙක්පත්, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත් හා ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර ලිවීම, නිකුත් කිරීම, භාර ගැනීම, පිටසන් කිරීම හා ගනුදෙනු කිරීම:

(ඌ) සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත සහ පාරිශ්‍රමික අනුව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කරවීම හා සේවයෙන් පහකිරීම:

(එ) තාණක විද්‍යාව පිළිබඳ පර්යේෂණ, ශක්‍යතා අධ්‍යයනය, පුහුණු හා වෙනත් වැඩසටහන් කරගෙන යාමට හැකිවනු පිණිස තැනැත්තන්ට අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ත්‍යාග, ආධාර ශිෂ්‍යත්ව, ශිෂ්‍ය පදවි සහ සමාන ත්‍යාග ලබා දීම:

(ඒ) සංස්ථාවේ අරමුණුවලට සමාන වූ හෝ එම අරමුණු වැඩිදියුණු කිරීම සඳහා යොමු වූ කාර්යයන්හි නිරත වන තැනැත්තන්ට, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවූ පුද්ගල මණ්ඩලවලට ප්‍රදාන, තෑගි, සහනාධාර හා ආධාර ලබා දීම:

(ම) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හා යෝග්‍ය වන්නා වූ වෙනත් සියලු පියවර ගැනීම.

කළමනාකරණ කමිටුව.

**5.** සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන නිලධරයන් යම් සංඛ්‍යාවකින් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින්, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

රීති සෑදීමට ඇති බලය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල, සංස්ථාවේ යම් වාර්ෂික, විශේෂ හෝ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් කාරණා අතුරින් යම් කාරණයක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්ව අත් හිටුවීම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) සංස්ථාවේ විවිධ වර්ගයේ සාමාජිකයන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද හා සුදුසුකම්;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඉවත් කිරීම, ඔවුන්ගේ බලතල, පැවැත්ම හා කාර්ය සහ කළමනාකරණ කමිටුවේ ධුර කාලය;

(ඈ) සාමාජිකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් සහ ග්‍රාහක මුදල් තීරණය කිරීම හා එකතු කිරීම සහ සංස්ථාවේ අරමුදල් වියදම් කිරීම, බැංකු ගිණුම් පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම :

(ඉ) සංස්ථාවේ හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී අනුගමනය කළ යුතු සහ එම රැස්වීම්වල කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය :

(ඊ) සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම සහ මුදල් කටයුතු :

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන කිසිම රීතියක් විශේෂ හෝ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන් හෝ අතුරින් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ ඊට කිසිවක් එකතු කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයේ බලපැවැත්වූ සංගමයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** සංස්ථාව වෙනුවෙන් හා එහි ප්‍රතිලාභය සඳහා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, නියෝජිතයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද ගෙවීම්වල ප්‍රමාණයට ඒ සාමාජිකයාට, නිලධරයාට, නියෝජිතයාට හෝ සේවකයාට සංස්ථාව විසින් ඒ මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය. ආපසු ගෙවීම.

**8.** සංස්ථාවේ මුද්‍රාව කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය. කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**9.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.